# සත්‍ය ආගම

## الدين الصحيح

## باللغة السنهالية

# සත්‍ය ආගම

කතෘ

අබූ අමීනාහ් බිලාල් ෆිලිප්ස්

පරිවර්තනය:

ඇස්. එම්. මන්සූර්

ප්‍රකාශකයෝ

කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්යාලය

අල් බදියා - සමාජ ඒකකය

රියාද් - සවුදි අරාබියාව

# ඉස්ලාම් ආගම

ඉස්ලාම් යනු, අරාබි වචනයකි. එහි තේරුම කුමක්ද යන්න දැනගැනීම හැම කෙනෙකුටම ඉතාමත් වැදගත් කරුණක් වන්නේය.

මෙලෝ ඇත්තාවූ ආගම් සියල්ල යම්කිසි පුද්ගලයෙකුගේ නාමයෙන් හෝ යම්කිසි සමාජයක නාමයෙන් හෝ ව්‍යවහාර වන බව පැහැදිලිවම පෙනෙන්නට ඇත. ක්‍රිස්තියානි ආගම ක්‍රිස්තුස් වහන්සේගේ නමින්ද, බුද්ධාගම ගෞතම බුදුන් වහන්සේගේ නමින්ද, කොන්පියුෂියස් ආගම කොන්පියුෂියස් තුමාගේ නමින්ද, මාර්ක්ස්වාදය කාර්ල් මාක්ස්ගේ නමින්ද ව්‍යවහාර වේ. එමෙන්ම යුදෙව් ආගම යූදියා රටේ යුදා ගෝත්‍රයේ උපත ලත්නිසා යුදෙව් ආගම යනුවෙනුත්, හින්දු ආගම ඉන්දියාවේ හින්දු සමාජයේ උපත ලත් නිසා හින්දු ආගම යනුවෙනුත් හඳුන්වනු ලැබේ.

නමුත් ඉස්ලාම් ආගම කිසිම පුද්ලයෙකුගේ නමින් හෝ කිසිම රටක, සමාජයක නමින් හෝ ව්‍යවහාර නොවෙයි. ඉස්ලාම් වනාහි විශ්වයාධිපති අල්ලාහ් විසින් මිනිසා වෙත පිරිනමනු ලැබූ සත්‍ය වූ ආගමක් ය. එහි අරමුණ නම් මුළු මිනිස් වර්ගයාම අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම අවනත වීමය.

"ඉස්ලාම්" යන අරාබි වචනයේ අවනත වීම, යටහත්වීම, කීකරු වීම යනාදි අරුත් ගැබ්වී ඇත. මේ අනුව යමෙකු අල්ලාහ්ට මුළුමනින්ම අවනත වී, ඔහුට පමණක් වැඳුම් පිදුම් කර ඔහු අණකළ පරිදි ජීවත්වන්නේ නම් එම තැනැත්තා මුස්ලිමෙකි. ඉස්ලාම් යන වචනයෙහි සාමය නම් අර්ථයද ගැබ්වී ඇත. මෙයින් තේරුම් කරගත යුත්තේ යමෙකු අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනත වී ජීවත්වීමෙන් ලැබෙන ස්වාභාවික ප්‍රතිඵලය නම් ඔහු කරා සාමය ලඟාවීම යන්නය.

ඉස්ලාමය සත්වෙනි ශත වර්ෂයේ අරාබිකරයේ ජීවත්වූ මුහම්මද් (සල්)* නබි තුමා විසින් ගෙන එනු ලැබූ අළුත් ආගමක් නොව එතුමාගේ මාර්ගයෙන් අන්තිම වරට දෙනු ලැබුවෙකි. ඇත්ත වශයෙන් ම ඉස්ලාමය අල්ලාහ් විසින් ප්‍රථමයෙන්ම දෙනු ලැබුවේ ප්‍රථම මිනිසා හා අල්ලාහ්ගේ පළමුවන නබිවරයා වන ආදම් (අලෛ)** තුමාටය. එතුමාගෙන් ආරම්භවූ මිනිස් වර්ගයා වෙත අල්ලාහ් විසින් එවනු ලැබූ සෑම නබිවරයෙකුගේම ආගම වූයේද ඉස්ලාමය.

---

*(සල්) සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම් අල්ලාහ් සිය ශාන්තිය හා සමාදානය ඔහු වෙත උදා කරත්වා!

** (අලෛ) අලෙයි හිස්සලාම් - ඔහු වෙත සාමය ඇති වේවා!

අල්ලාහ් විසින් පිරිනමනු ලැබූ මෙම ආගමට ඉස්ලාම් යන නම තැබුවේ මිනිසුන් විසින් නොවේ. එම නම අල්ලාහ් විසින්ම තබන ලදි. මේ ගැන ශුද්ධවූ අල්-කුර්ආනය ඉතාමත් පැහැදිලිව පවසන්නේය.

අල්කුර්ආනය මෙසේ කියයි.

ٱلۡيَوۡمَ أَكۡمَلۡتُ لَكُمۡ دِينَكُمۡ وَأَتۡمَمۡتُ عَلَيۡكُمۡ نِعۡمَتِي

وَرَضِيتُ لَكُمُ ٱلۡإِسۡلَٰمَ دِينٗاۚ

***අද දින ඔබ වෙනුවෙන් ඔබගේ ආගම සම්පූර්ණ කර ඇත්තෙමි. තවද, මාගේ ප්‍රසාදයන් ද සම්පූර්න කර ඇත්තෙමි. එමෙන්ම, ඔබ වෙනුවෙන් වූ ආගම ලෙස ඉස්ලාමය තෝරාගෙන ඇත්තෙමි. (අල්කුර්ආනය 5 : 3)***

وَمَن يَبۡتَغِ غَيۡرَ ٱلۡإِسۡلَٰمِ دِينٗا فَلَن يُقۡبَلَ مِنۡهُ

***තවද, ඉස්ලාම් නොවන වෙන ආගමක් යමෙකු විසින් අපේක්ෂා කරන්නේ නම් එය ඔහුගෙන් කිසිසේත් පිළිගනු නොලැබේ.***

***(අල් කුර්ආනය 3 : 85)***

මූසා (මෝසස්) නබි තුමාණන්ගේ අනුගාමිකයින් හෝ ඔවුන්ගෙන් පැවත එන්නන් අමතා “ ඔබ සැමගේ ආගම යුදෙව් ආගමය” යනුවෙන් අල්ලාහ් ප්‍රකාශ කළ බව බයිබලයේ කොතැනකවත්

සඳහන් වී නැත. එමෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයින්ට ද ඔවුන්ගේ ආගම ක්‍රිස්තියානි ආගම යැයි ප්‍රකාශ කර නැත.

අපි දැනගත යුතු වැදගත් කාරණයක් ඇත. එනම්, "ක්‍රයිස්ට්" හා "ජීසස්" යන නාමයන් යේසුස් වහන්සේගේ නාමයන්ද? ඇත්ත වශයෙන් ම එසේ නැත. මේවා එතුමාගේ නාමයන් නොවේ. "ක්‍රයිස්ට්" නම "ක්‍රිස්ටෝස්" නම් වූ ග්‍රීක වචනයකින් උපත ලැබූවකි. "ක්‍රිස්ටෝස්" යනු අභිෂේක කරනු ලැබූ නම් අරුත වෙයි. "ක්‍රයිස්ට්" යනු මෙසයියාහ් නම් වූ හීබෲ නමෙහි ග්‍රීක අනුවාදය වේ. තවද, ජීසස් යනු ඊසා නම් වූ හීබෲ නමේ ලතින් පරිවර්තනය වේ.

මෙසේ කරුණු ඇතත්, පහසුව තකා මෙම පොත් පිංචයෙහි ඊසා නබි තුමාගේ නම යේසුස් යනුවෙන්ම මා භාවිතා කරමි.

ලොව පහළවූ අනෙක් නබිවරුන් මෙන්ම යේසුස් නබි තුමාණෝත් තමන්ගේ අනුගාමිකයන්හට දේශනය කළේ අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම අවනත වන ලෙසය. තවද, මිනිසා තමාගේ සිතින් මවා ගන්නා ව්‍යාජ දේව විශ්වාසයන්ගෙන් ද ඈත්වී සිටින ලෙස එතුමා තම අනුගාමිකයන්හට අවවාද කළහ. මෙය ඉස්ලාමය.

බයිබලයේ අළුත් ගිවිසුම අනුව "ස්වර්ගයේ මෙන් මෙලොවෙහිදීත් ඔබගේ අණය ඉටුවේවා" යනුවෙන් ප්‍රාර්ථනා කරන ලෙසය එතුමා තම අනුගාමිකයන්ට ඉගැන්වූයේ.

## ඉස්ලාමයේ පණිවිඩය

අල්ලාහ්ගේ දිව්‍යමය ආගම වූ ඉස්ලාමයේ මූලික පණිවිඩය වන්නේ මුළු මිනිස් සංහතියම ඔහුට සම්පූර්ණයෙන්ම අවනතවිය යුතු බවය. ඔහුගේ අණට කීකරු විය යුතු බවය. ඔහු ගෙන දක්වා ඇති අවවාද අනුශාසනා පිළිපදිමින් ජීවත් විය යුතු බවය.

මිනිසා අල්ලාහ්ට හැර වෙන යම්කිසි පුද්ගලයෙකුට, පිළිමයකට, ගින්නට, ස්ථානයකට හෝ වෙන මොනම දෙයකටවත් වැඳුම් පිදුම් කිරීමෙන් වැළකී සිටීම ඉස්ලාම් නම් වේ.

මෙලොව ඇති සෑම දෙයක්ම මවන ලද්දේ අල්ලාහ් විසින්ය. එම නිසා ඉස්ලාමය කියා සිටින්නේ මැවීම්වලට වැඳුම් පිදුම් නොකර මැවුම් කාරයා වූ අල්ලාහ්ට (එසේ) වැඳුම් පිදුම් කරන ලෙසය. මිනිසාගේ වැඳුම් පිදුම් ලැබීමට එකම සුදුස්සා අල්ලාහ් පමණය. එමෙන්ම මිනිසාගේ ප්‍රාර්ථනාවන්ට පිළිතුරු දෙන්නේද අල්ලාහ් පමණය. යම් කෙනෙකු ගසකට ප්‍රාර්ථනා කර එම ප්‍රාර්ථනාවට පිළිතුරක් ලැබුනේ නම්

එම පිළිතුර ගසෙන් නොව, එවැනි පිළිතුරක් ලැබීමෙහිලා අල්ලාහ්ගේ නියමයක්, අවස්ථාවක් තිබී ඇත. ඒ අනුව එම පිළිතුර ලැබී ඇත යන්නය සත්‍යය වන්නේ. සමහරෙකු කියන්න පුළුවනි එය එසේ නොවන බව. ගසකට වැඳුම් පිදුම් කිරීමෙහි කිසිම සත්‍යතාවයක් නැත.

එපමණක් නොව, යේසුස් තුමා, බුදුන් වහන්සේ, ක්‍රිෂ්ණා. ශාන්ත ක්‍රිස්ටෝපර් තුමා, ශාන්ත ජූඩතුමා පමණක් නොව මුහම්මද් (සල්) නබි තුමාට පවා ප්‍රාර්ථනා කිරීමෙහිලා පිළිතුරු ලබා නොගතිමු. ප්‍රාර්ථනාවන්ට පිළිතුරු දෙනු ලබන්නේ අල්ලාහ් විසින් පමණය. ජේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට දේශනා කළේද අල්ලාහ් හැර තමන් වෙත ප්‍රාර්ථනාවන් නොකළ යුතු බවය.

අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.

وَإِذْ قَالَ ٱللَّهُ يَـٰعِيسَى ٱبْنَ مَرْيَمَ ءَأَنتَ قُلْتَ لِلنَّاسِ
ٱتَّخِذُونِى وَأُمِّىَ إِلَـٰهَيْنِ مِن دُونِ ٱللَّهِ ۖ قَالَ سُبْحَـٰنَكَ مَا
يَكُونُ لِىٓ أَنْ أَقُولَ مَا لَيْسَ لِى بِحَقٍّ ۚ

***තවද, අල්ලාහ් අසන්නේය. මරියම්ගේ පුත් ජේසුස්! අල්ලාහ් හැර මාද මගේ මවද දෙවිවරු දෙදෙනකු කරගනිවුයි යනුවෙන් මිනිසුන් හට ඔබ කීවෙහිදැ'යි පවසන කල්හි ඔබ ඉතා පරිශුද්ධය. මා හට අයිතියක් නැති දේ ගැන මා කිසිවක් නොකියමි.***

***(අල්කුර්ආන් 5:116 )***

යේසුස් තුමා තමන්ට තමන්ම වැඳුම් පිදුම් කරගත්තේද නැත. එතුමාද සම්පූර්ණයෙන්ම අවනත වූයේත් වැඳුම් පිදුම් කළේත්, අල්ලාහ්ටමය. කුර්ආනයේ ෆාතිහා නම් පරිච්ඡේදයේ සතරවෙනි වාක්‍යයෙහි මෙම මූලික අදහස ගැබ්වී ඇත.

إِيَّاكَ نَعۡبُدُ وَإِيَّاكَ نَسۡتَعِينُ

***ඔබට පමණක් අපි ඉබාදත් (වැඳුම් පිදුම්) කරමු. ඔබෙන් පමණක් පිහිට පතමු. (අල් කුර්ආන් 1:4)***

ශුද්ධ කුර්ආනයෙහි තවත් තැනක අල්ලාහ් මෙසේ පවසයි.

وَقَالَ رَبُّكُمُ ٱدۡعُونِيٓ أَسۡتَجِبۡ لَكُمۡۚ

***ඔබේ අධිපතියා පවසයි: ඔබ මා වෙත ප්‍රාර්ථනා කරන්න මම ඔබ (ප්‍රාර්ථනාවන් ) ට පිළිතුරු දෙමි.***
***(අල්කුර්ආන් 40:60)***

ඉස්ලාමයේ මූලික පණිවිඩයේ අඩංගු වැදගත් අදහසක් නම් අල්ලාහ්ටත් ඔහුගේ මැවීම්වලටත් අතර විශාල වෙනසක් ඇති බවය. අල්ලාහ් ඔහුගේම මැවීමක් හෝ එහි කොටසක් නොවන්නා සේම ඔහු විසින් මවන ලද අනෙකුත් දේ ද ඔහු හෝ ඔහුගෙන් කොටසක් නොවන්නේය.

මෙය පැහැදිලිවම පෙනෙන්නට ඇතත් මැවුම්කරු වෙනුවට ඔහුගේ මැවීම් වැඳ පුදා ගෞරව කිරීම ඉතාමත් අනුවන ක්‍රියාවක් බව එවැනි ක්‍රියාවන්හි යෙදී සිටින්නන්ට නොපෙනීම පුදුමයකි. අල්ලාහ් (දෙවියන්) ගේ මැවීම්වලට වැඳුම් පිදුම් කරන්නන් අල්ලාහ් (දෙවියන්) ඔහුගේ සෑම මැවිල්ලකම එකඟවී ඇති බවත්, ඔහුගේ සමහර මැවිලි තුලින් ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතුවන බවත් අදහති. එසේ හෙයින්, එම මැවීම්වලට වැඳුම් පිදුම් කිරීම තුලින් අල්ලාහ්ට වැඳුම් පිදුම් කරනවා මෙන්යැයි ඔවුන් තර්ක කරති.

එනමුත් අල්ලාහ්ගේ වක්තෘන් (නබිවරුන්) විසින් මිනිසා වෙත ගෙන එනු ලැබූ පණිවිඩයෙහි සඳහන් වන්නේ මිනිසා අල්ලාහ්ට පමණක් වැඳුම් පිදුම් කළ යුතු බවය. එමෙන්ම ඔහුගේ මැවීම්වලට කෙළින් හෝ

වචින් පිටින් අවනතවීමෙන් හෝ වැඳුම් පිදුම් කිරීමෙන් වැළකී සිටිය යුතු බවය.

අල්ලාහ් මෙසේ කියයි.

وَلَقَدۡ بَعَثۡنَا فِي كُلِّ أُمَّةٖ رَّسُولًا أَنِ ٱعۡبُدُواْ ٱللَّهَ وَٱجۡتَنِبُواْ ٱلطَّٰغُوتَ

***සහතික ලෙස, ඔබ අල්ලාහ්ට වැඳුම් පිදුම් කරන්න. අසත්‍ය දෙවිවරුන්ගෙන් ඈත් වී සිටින්න යනුවෙන් (උපදෙස් දෙනු සඳහා) අප මුළු මිනිස් වර්ගයා වෙතම නබිවරයෙක් යවා ඇත්තෙමු. (අල්කුර්ආන්16:36)***

පිළිමවලට වැඳ පුද සත්කාර කරන (දේව විශ්වාසය ඇති) පිරිමියෙකුගෙන් හෝ ස්ත්‍රියෙකුගෙන් මිනිසා විසින් අඹන ලද පිළිම ඉදිරියේ වැඳ වැටෙන්නේ ඇයිද? යනුවෙන් විමසුවහොත් දෙදෙනාගෙන්ම එක වගේම පිළිතුරක් ලැබෙනවාට සැකයක් නොමැත. එම පිළිතුර නම් "ඔවුන් ගලෙන් හෝ මැටියෙන් වූ එම පිළිමයන් නොවඳින බවත්, එතුලින් දෙවියන් වහන්සේ හට වඳින බවත්" වේ. ඔවුන් පවසන්නේ එම ගල් හෝ මැටි පිළිමයන් දෙවියන් නොවන බවත් දෙවියන් කරා සිත යොමු කරන්නට යම් ක්‍රමයක් ලෙස තබාගෙන සිටින බවත්ය. දෙවියන් වහන්සේ තමන් විසින් මවන ලද දේ

තුල රැඳී සිටින්නේය යන මතය අදහන්නෙක් සමහර විට මෙම තර්කය පිළිගනු ඇත.

එනමුත්, ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්ති නිසිලෙස වටහාගෙන, ඒ සමග කිට්ටු සම්බන්ධතාවයන් පවත්වාගෙන යන යම් කෙනෙක් ඇත්නම් ඔහු මෙම තර්කය කිසිසෙත් පිළිගන්නේ නැත. සෑම යුගයකම තමන්හට දේවත්වය ඇති බව ප්‍රකාශ කළවුන්, "මිනිසා තුල දෙවියන් පැවත සිටින" බව වූ මෙම වැරදි මතය මුල්කරගෙනයි එසේ ප්‍රකාශ කළේ. ඔවුන්ගේ මෙම වැරදි මතය අනුව මිනිසා තුල දෙවියන් පැවැත එන බව කියතත්, අනෙක් මිනිසුන්ට වඩා තමා සමග දෙවියන් එකඟ වී පැවත එන බවත් ඔවුන් තර්ක කරති. ඔවුන්ම දෙවියන් වශයෙන් හෝ දෙවියන් ඔවුන් තුල ඇති නිසා හෝ සෙස්සන් ඔවුනට අවනතවී වැඳුම් පිදුම් කළයුතු යැයි කියා සිටිති. මෙම දේවත්වවාදීන් මරණයට පත්වූවායින් පසු ඔවුන්ගේ අනුගාමිකයින් මෙම මතය පිළිගත්තන් අතර ප්‍රමුඛස්ථානයක් ගෙන ජීවිතය භුක්ති විඳිති.

ඉස්ලාමයේ මූලික ඉගැන්වීම් සම්බන්ධව සාමාන්‍ය දැනීමක් ඇති කෙනෙක් පවා තමන් මෙන් වූ තවත් මිනිසෙකුට කුමන අවස්ථාවක වුවත් වැඳ වැටෙන්නට හෝ පුද පූජා කිරීමට හෝ කිසිසේත් එකඟ නොවේ.

මැවුම්කාරයාට වැඳීමටත්, මැවීම්වලට වැඳුම් පිදුම් කිරීම ප්‍රතික්ෂේප කිරීමටත් කෙරෙන පැහැදිලි ඇරයුම, දෙවියාගේ ආගමේ සාරාංශය වේ. එය පහත සඳහන් කුඩා වාක්‍යයෙන් මනාව පැහැදිලි වේ.

## لا إله إلا الله

## ලා ඉලාහ ඉල්ලල්ලාහ්

නැමදීමට සුදුස්සා "අල්ලාහ් හැර වෙන දෙවි කෙනෙක් නැත" යන්න මෙහි තේරුමයි.

ඉහත සඳහන් මෙම වාක්‍යය යමෙක් සිතෙන් පිළිගෙන ඒ අනුව ජීවත් වෙමියි යනුවෙන් අධිෂ්ඨාන කර මුවින් කියන්නේ නම් ඔහු මුස්ලිමයෙකි. ඉස්ලාමය කරා ලඟාවූවෙකි. මෙය අවංකවම යමෙක් අදහන්නේ නම් ඔහු නිසැකවම ස්වර්ගය ලබාගන්නේය. මුහම්මද් (සල්) තුමා මෙසේ පැවසූ බව අබූදර් (රලි)* තුමා වාර්තා කරයි. "කවරෙකු හෝ අල්ලාහ් හැර නැමදීමට සුදුසු වෙන දෙවි කෙනෙක් නැත. යනු ප්‍රකාශකර ඒ සමගම (විශ්වාසවන්තයෙකු ලෙස) මරණයට පත්වන්නේ නම් ඔහු ස්වර්ගයට ඇතුල් වෙයි."

(බුහාරි මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

එක දෙවියෙකු වශයෙන් අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනතවීම, ඔහුගේ අණට කීකරුවීමේ

---

*(රලි) රලියල්ලාහු අන්හු - අල්ලාහ් ඔහු පිළිගනිත්වා!

ආශිර්වාදයන් ලබා ගැනීම, බහුදේව වාදය හා බහු දේවවාදීන් ප්‍රතික්ෂේප කිරීම යනාදි කරුණු මෙම වාක්‍යයෙහි අඩංගු වේ.

## අසත්‍ය ආගම් ගෙන එන පණිවිඩය

ලෝකයේ නොයෙකුත් ආගම් ඇත. දර්ශනයන් හා ඇදහිලි ක්‍රම ඇත. සංවිධානයන් හා විවිධ මත දරණ කොටස් ඇත. මේවායේ නියැලී සිටින්නන් කියන්නේ ඔවුන් යහමග සිටින බවත්, දෙවියන්ගේ සත්‍ය මාර්ගයෙහි සිටින බවත්ය. මෙම සියළු කොටස් සත්‍යයෙහි සිටින්නේද? මෙය කෙසේ දැනගනිමුද? මේ සඳහා වූ සාධක මොනවාද?

මෙම ප්‍රශ්ණවලට පිළිතුරු ලබාගත හැකි කිසියම් ක්‍රමයක් ඇත. එනම් මෙම ආගම්වලට හෝ කොටස්වලට ඇතුලත් වී ඇති ලස්සන වචනවලින් අලංකාරවූ කරුණුවලින් එහා ඇත්තාවූ, ඒවායේ මූලික අරමුණ හා සත්‍යය කුමක්ද යනු බැලිය යුතුයි. කෙළින් හෝ වටින් පිටින් ඒ ඒ ආගමිකයින් කුමණ ක්‍රමයක වූ වැඳුම් පිදුම් කරා මිනිසා කැඳවන්නේ දැයි බැලිය යුතුයි.

එවිට දෙවියන් ගැන මෙම අසත්‍ය ආගම් හා කොටස්වලට පොදුවූ මූලික අදහස් රැසක් ඇතිබව ඔබ දැනගන්නවා ඇත. ඒ අදහස් නම්, "සෑම මිනිසෙකුම දෙවි කෙනෙක්ය" "සමහර විශේෂ මිනිසුන් දෙවියන්

වන්නේය.", "ස්වභාවය දේවත්වය ඇත්තකි." නැතිනම් "දෙවියන් මිනිසාගේ කල්පනා ශක්තියෙන් මවා ගත්තෙකි." යනු ඒවා වේ.

අසත්‍ය ආගම් කියා සිටින්නේ දෙවියන් නැමදිය යුත්තේ ඔහුගේ මැවීම්වල හැඩහුරුකම් අනුව බවය. මෙම චේතනාව ලත් එම අසත්‍ය ආගම් මිනිසා තම ආගම කරා කැඳවන්නේ මැවීම් හෝ ඒවායේ කිසියම් කොටස් දේවත්වය දරණ බව කීමෙන්ය.

උදාහරණයක් වශයෙන් ජේසුස් තුමා ගැන කිව හැකිය. එතුමා තමන්ගේ අනුගාමිකයින්ට අණ කළේ අල්ලාහ්ට පමණක් වන්දනය කළයුතු බවයි. නමුත් එතුමාගේ අනුගාමිකයින් ලෙස පෙනී සිටින්නන් අද යේසුස් තුමා දෙවියා බව කියා එතුමා නැමදීමට මිනිසුන්හට ඇරයුම් කරති.

බුදුන් වහන්සේ සංශෝධකයෙකි. එතුමා ඉන්දිය ආගමට මානව හිතවාදී ප්‍රතිපත්ති රැසක් හඳුන්වා දුන්නේය. එතුමා තමන් දෙවිකෙනෙක් බව කිසිවිටෙක කියා සිටියේ නැත. එමෙන්ම තමන්ට වැඳුම් පිදුම් කළ යුතු බවත් එතුමා නොපැවසූහ. එනමුත් අද ඉන්දියාවෙන් පිටත සිටින (සමහර නිකායට අයත්) බොහෝ බෞද්ධයන් බුදුන් වහන්සේ දෙවියන් මෙන් සලකා එතුමාගේ නමින් පිළිම අඹා ඒවාට වැඳ පුද සත්කාර කරති.

වැඳුම් පිදුම් කිරීමේ අරමුණ නිසි ලෙස හඳුනා ගැනීමේ චේතනාව තුලින් අසත්‍ය ආගම් දෙස නෙත් යොමුකරන්නේ නම්, ඒවායේ අසත්‍යතාවය හොඳ හැටි මනාව පැහැදිලිව පෙනෙන්නේය. එමෙන්ම ඒ ආගම්හි ස්වාභාවික ආරම්භය කෙසේ විකෘති වීදැයි දැනගැනීමට ද හැක.

අල්ලාහ් මෙසේ පවසයි.

مَا تَعۡبُدُونَ مِن دُونِهِۦٓ إِلَّآ أَسۡمَآءً سَمَّيۡتُمُوهَآ أَنتُمۡ وَءَابَآؤُكُم مَّآ أَنزَلَ ٱللَّهُ بِهَا مِن سُلۡطَٰنٍۚ إِنِ ٱلۡحُكۡمُ إِلَّا لِلَّهِۚ أَمَرَ أَلَّا تَعۡبُدُوٓاْ إِلَّآ إِيَّاهُۚ ذَٰلِكَ ٱلدِّينُ ٱلۡقَيِّمُ وَلَٰكِنَّ أَكۡثَرَ ٱلنَّاسِ لَا يَعۡلَمُونَ

***ඔහු (අල්ලාහ්) හැර ඔබ වැඳුම් පිදුම් කරන සෑමයක්ම ඔබ හා ඔබගේ මුතුන් මිත්තන් විසින් තබාගත් නම් හැර වෙන කිසිවක් නැත. ඒවාහට අල්ලාහ් කිසිම අවසරයක් පහළ කළේ නැත. අල්ලාහ්ට හැර (අන් කිසිවෙකුට) බලයක් නැත. ඔහු හැර (අන්කිසිවෙකුට) ඔබ වැඳුම් නොකළ යුතු බව (අලලාහ්) ඔහු (ඔබට)***

***තදින්ම අණකර ඇත. සත්‍ය වූ ආගම ද මෙයයි. නමුත් මිනිසුන්ගෙන් වැඩි දෙනෙක් මෙය නොදනී.***
***(අල් කුර්ආන් 12:40)***

ආගම් සියල්ල යහපත් දේ කියාදෙයි. උගන්වයි. එම නිසා එක ආගමක් පමණක් ඇදහිය යුතුයි යනුවෙන් පවස්නේ ඇයි? යනුවෙන් කවරෙකු හෝ තර්කානුකූලව වාද කළ හැක. මෙයට විසඳුම නම්, සෑම ආගමක්ම මැවීම්වලට වැඳුම් පිදුම් කිරීමේ පාපය උගන්වයි. මිනිසා කරන ඉතාමත් බලවත් පාපයක් වේනම්, එය මැවීම්වලට වැඳුම් පිදුම් කිරීමය. එසේ වැඳුම් කිරීම මිනිසා මැවීමේ අරමුණට ඉදුරාම විරුද්ධ කාය්‍යයකි. මිනිසා මවා ඇත්තේ අල්ලාහ්ට පමණක් අවනත වීමටය. කීකරු වීමටය; වැඳුම් පිදුම් කිරීමටය, අල්ලාහ් ඉතාමත් පැහැදිලිව තම ශුද්ධ ග්‍රන්ථයේ මෙසේ කියයි.

وَمَا خَلَقْتُ ٱلْجِنَّ وَٱلْإِنسَ إِلَّا لِيَعْبُدُونِ

***තවද ජින් (වර්ගයා) හා මිනිස් (වර්ගයා) මා හට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනත වී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මා හට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවූයේ නැත.***
***(අල්කුර්ආන් 51:56)***

පිළිමවලට වැඳුම් පිදුම් කිරීමට තුඩුදෙන, මැවීම්වලට වන්දනය කිරීම වනාහි අල්ලාහ්ගේ සමාව නොලැබිය හැකි මහා පාප ක්‍රියාවකි. මෙම පාප

ක්‍රියාවේ යෙදෙන්නා ඒ තත්වය යටතේ මරණයට පත්වේ නම්, ඔහු මරණින් පසු සදාකාලික ලෙස අපාගත වෙනවාට කිසිම සැකයක් නැත. මෙය සාමාන්‍ය අදහසක් නොවේ. අල්ලාහ් තආලා තම ග්‍රන්ථයේ මේ ගැන විශේෂයෙන් පවසා ඇත.

إِنَّ ٱللَّهَ لَا يَغۡفِرُ أَن يُشۡرَكَ بِهِۦ وَيَغۡفِرُ مَا دُونَ ذَٰلِكَ لِمَن يَشَآءُۚ

***අල්ලාහ් තමන් හා හවුල්කරුවන් ඇති කිරීමට (කිසිසේත්) සමාව නොදෙන්නේය. නමුත් ඔහු මේ නොවන (පාප) ක්‍රියාවන් සඳහා තමන් කැමති අයට සමාව දෙයි.***

***(අල්කුර්ආන් 4:48, 116)***

## මුළු විශ්වයටම පොදු ධර්මය ඉස්ලාම්

අසත්‍ය ආගම් ඇදහීමෙන් මිනිසා නොමග යන නිසා අල්ලාහ්ගේ සත්‍ය ආගම එනම් ඉස්ලාමය මුළු ලෝ වැස්සන්ම අවබෝධ කරගැනීමත්, ඉනික්බිතිව එය තමන් සතු ආගමක් ලෙස පිළිපැදීමත් ඉතා වැදගත්ය. ඉස්ලාමය යම් සමාජයකට,රටකට,ස්ථානයකට හෝ කාලයකට

පමණක් සීමා වූ ආගමක් නොවේ. මෙය අදහන්නෙක් ස්වර්ගය ලබාගැනීම සඳහා ඥානස්නානය කිරීමක් හෝ තමන්ගේ ගැලවීම සඳහා යම් පුද්ගලයෙකුගේ උදව් උපකාර මත රැඳී සිටිය යුතුය යනු අදහසක් හෝ නැත. ඉස්ලාමය සමස්ථ විශ්ව ධර්මයක් ලෙස රැඳා පවතින්නේ එහි වූ මූලික ප්‍රතිපත්තිය වූ අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනත විය යුතුය යන්නෙහිය.

අල්ලාහ්ගේ ඒකත්වය, ඔහුගේ මැවීම් හා ඔහු අතර ඇති වෙනස්කම් යනාදිය මිනිසා කවදා හෝ දැනගෙන ඔහුට සම්පූර්ණයෙන්ම අවනත වන්නේ නම් ඔහු කය හා ආත්මය දෙකෙන්ම මුස්ලිමෙක් වෙයි. ස්වර්ගය ලැබීමටද ඔහු සුදුස්සෙක් වෙයි. ඉතාමත් දුර බැහැර ප්‍රදේශයක අප්‍රසිද්ධව ජීවත්වන්නෙක් වුවත් ඕනෑම වේලාවක අල්ලාහ්ගේ මැවීම්වලට පුද පූජා කිරීමෙන් හෝ වැඳ වැටීමෙන් වැළකී අලලාහ්ට පමණක් අවනත වීමෙන් ඔහු මුස්ලිම් බැතිමතෙක් වේ.

තවත් වැදගත් කරුණක් නම් අල්ලාහ්ට අවනතවීම රැඳා පවතින්නේ කෙනෙකුගේ හොඳ නරක දෙකෙන් එකක් තෝරා ගැනීමෙහි හා වගකීම් භාවයෙහිය. ඉස්ලාමයේ ගෙන දක්වා ඇති කරුණු අනුව නරකින් ඈත් වී හොඳ දේ තෝරා ගන්නා අල්ලාහ්ට අවනතවන්නෙකි.

මිනිසාගේ තේරීම්වලට ඔහුම වගකිවයුත්තා වේ. එම නිසා හැකිතරම් යහපත් ක්‍රියාවන්හි නියැලී

සිටීමටත් අයහපතින් ඈත්වී සිටීමටත් වෑයම් කළ යුතුය. යහපත් ක්‍රියාව නම් අල්ලාහ්ට අවනත වී ඔහුට පමණක් වන්දනය කිරීමය. අයහපත් නින්දිත ක්‍රියාව නම් අල්ලාහ්ගේ මැවීම්වලට වැඳීම හෝ අල්ලාහ්ටත් ඔහුගේ මැවීම් යන දෙකටම වැඳීමය.

කුර්ආනයේ මේ බව සඳහන් වෙයි.

إِنَّ ٱلَّذِينَ ءَامَنُواْ وَٱلَّذِينَ هَادُواْ وَٱلنَّصَٰرَىٰ
وَٱلصَّٰبِـِٔينَ مَنْ ءَامَنَ بِٱللَّهِ وَٱلْيَوْمِ ٱلْءَاخِرِ وَعَمِلَ
صَٰلِحًا فَلَهُمْ أَجْرُهُمْ عِندَ رَبِّهِمْ وَلَا خَوْفٌ عَلَيْهِمْ وَلَا
هُمْ يَحْزَنُونَ

***ඊමාන්ධාරීන් (විශ්වාසවන්තයන්) යුදෙව්වරුන් ක්‍රිස්තියාණින් හෝ සාබිර්න්වරුන් අතුරෙන් කවරෙක් හෝ අල්ලාහ් සහ කියාමත් දිනය (අවසාන දිනය) විශ්වාසකරමින් යහපත් ක්‍රියා කරයි ද ඔවුහු ඔවුන්ගේ ස්වාමින් වෙතින් තමන්ට හිමි ත්‍යාගය ලබාගනු ඇත. ඔහු වෙත බිය, ශෝකය හෝ දුක් කම්කටොළු නොපැමිණෙනු ඇත. ( අල්කුර්ආන් 2:62)***

කුමණ හේතුවක් නිසා හෝ අවසාන දේව පණිවිඩය, ඔවුන්හට එය සක්සුදක් සේ පැහැදිලි ලෙස විස්තර කිරීමෙන් පසුත් එය පිළිගැනීමට අපොහොසත් වන්නේ නම් ඔවුන්ගේ තත්ත්වය අනතුරුදායක වේ.

මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ පැවැසූහ.

කිතුනුවන් සහ යුදෙව්වරුන් අතරින් කවරෙකු හෝ මා පිළිබඳ සුභාරංචිය ලබාගැනීමෙන් පසුවද මා ගෙන ආ පණිවිඩය කෙරෙහි ඔහුගේ විශ්වාසය ස්ථිර නොකර ඒ තත්ත්වයෙහි මරණයට පත්වන්නේද එවැන්නකු අපාගත වූවන් සමග වාසය කරයි. (සහීහ් මුස්ලිම් )

## අල්ලාහ් හඳුනා ගැනීම

මෙහි නැගෙන තවත් ප්‍රශ්ණයක් ඇත. එනම් නොයෙකුත් සමාජීය, සංස්කෘතික පරිසරයන්හි ජීවත්වන සෑම මිනිසෙක්ම අල්ලාහ් කෙරේ විශ්වසය තැබිය යුතුය යන්න කෙසේ බලාපොරොත්තු වෙමුද? යනු එම ප්‍රශ්ණය වේ. අල්ලාහ්ට අවනතවී නැමදුම් කිරීමේ වගකීම මිනිසුන් වෙත පවරා තිබේ නම් ඒ සඳහා අල්ලාහ් ගැන දැන ගැනීමේ මගක් තිබීම අවශ්‍ය නේද?.

අල්ලාහ් එවැනි දැනීමක් ලබා ගැනීමෙහිලා මිනිසා අනාථයෙක් බවට පත් කළේ නැත. මුළු මිනිස් වර්ගයාම අල්ලාහ් හඳුනා ගැනීමේ ශක්තිය ස්වාභාවිකව මිනිසාගෙන්ම කොටසක්වන ආත්මයෙහි

එකඟවී ඇත. අවසාන පොත වන අල්කුර්ආනයද මෙය පවසයි.

කුර්ආනයේ අල් අඃරාෆ් සූරාවේ 172, 173 ශුද්ධ වාක්‍යයන්හි, ආදම් (අලෛ) නබි තුමා මැවූ විට, එතුමාගේ අනාගත පැවත එන්නන් එක්රැස්කොට අල්ලාහ් මෙසේ විමසූ බව කියැවේ.

“මම ඔබ (සැම) ගේ දෙවියා නේද?” එවිට ඔවුන් “එසේමය (ඔබ අපේ දෙවියාය යනුවෙන්) අපි සාක්ෂි දරමු”යි කියා සිටියෝය. මේ අන්දමේ පොරොන්දුවක් ආරම්භයේදීම අලලාහ් විසින් ඔවුන් ගෙන් ලබාගෙන ඇත.

ඉතික්බිතිව, තමන්මය ලොව නිර්මාතෘවරයා තමන්ට පමණය නැමදුම් කළ යුත්තේ යනුවෙන් පොරොන්දුවක් ගත්තේ ඇයි දැයි අල්ලාහ් මෙසේ කියයි.

සමහර විට ඔබ (මිනිස් වර්ගයා) මරණින් පසු නැවත නැගිට වූවිට "ඇත්තෙන්ම අපි මේ ගැන කිසිවක් නොදනිමු" යැයි කියන්නට පුළුවන් හෙයින් ය. ඒ කියන්නේ "අල්ලාහ් අපගේ දෙවියන් බව අපි නොදනිමු. ඔහුට පමණක් නැමදිය යුතු බව අපිට කිසිවෙක් කීවේ නැත." යනුවෙන් තර්ක කරන්නට

පුළුවන් නිසාය, ඉහත සඳහන් පොරොන්දුව ගනු ලැබුවේ.

තවත් අල්ලාහ් මෙසේ විස්තර කරයි.

ඔබ කියන්න පුළුවනි "නිසැකවම අපගේ මුතුන් මිත්තන්ය (අල්ලාහ්ට) කොටස්කරුවන් ඇති කළේ. අපි ඔවුන්ගෙන් පැවත එන්නෝ වෙමු. (අපරාද කරුවන්) කළ වැරදි සඳහා අපව විනාශ කරන්නේද?"

අල්ලාහ් මෙසේ විස්තර කිරීමෙන් පෙනී යන්නේ උපත ලබන සෑම දරුවෙක්ම අල්ලාහ් ගැන වූ ස්වාභාවික විශ්වාසය ඇතිව ඉපදෙන බවය. ඔමෙන්ම අල්ලාහ්ට පමණක් නැමදීමේ ආශාවක්ද ස්වභාවයෙන්ම ඔහුතුල පැවතෙන බව නිසැකය. එය අරාබි භාෂාවෙන් ''ෆිත්රාහ්'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

එම දරුවා තනියම තබා අපි ඉවත්වී සිටින්නේ නම්, ඔහුගේ වැටහීම අනුව අල්ලාහ්ට වන්දනය කරයි. නමුත්, ඔවුන් වෙනස්වන්නේ ඔවුන්ගේ පරිසරයේ පෙනෙන නොපෙනෙන දේ අනුවය. අල්ලාහ් විසින් පවසනු ලැබූ බව මුහම්මද් (සල්) තුමා මෙසේ සඳහන් කරයි. "මම මගේ දාසයන් සත්‍ය ආගමෙහි මැවුයෙමි නමුත් දුෂ්ඨයන් ඔවුන් නොමග යැවීය."

(මහම්මද්) (සල්) නබිතුමා මෙසේද කී සේක.

සෑම දරුවෙක්ම "ෆිත්රාහ්" නමැති තත්වයේ උපත ලබයි. ඉනික්බිතිව (ඔවුන්ගේ) දෙමාපියෝ ඔහු යුදෙව්වෙක්, ක්‍රිස්තියාණියෙක් හෝ සොරෝස්තරයෙක් කරන්නේය. (බුහාරි මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

අල්ලාහ් විසින් ඇතිකරන ලද ස්වාභාවික වූ බාහිර නීතීන් අනුව දරුවා තම දෙවියන්ට අවනත වන්නාසේම, ඔහුගේ ආත්මයද ස්වාභාවිකවම තමාගේ දෙවියන්ට අවනත වන්නේය. මෙය ස්වාභාවිකවම කෙරෙන දෙයකි. නමුත්, ඔහුගේ දෙමව්පියෝ ඔවුන්ගේ අඩිපාරේ, ඇදහිලි ක්‍රම අනුව ගෙන යෑමට ප්‍රයත්න දරති. එවිට, එයට විරුද්ධ වීමට තරම් ශක්තියක් එම දරුවාගේ ආරම්භ කාලයේ නොමැතිකම නිසා තම දෙමාපියන්ගේ අඩිපාරේ ගමන් කරන්නට හැකිය. එම අවධියේ ඒ දරුවා පිළිපදින ආගම නම් යම් යම් සිරිත් විරිත් වලින් යුක්තකි. මේ ගැන ඔහු අල්ලාහ්ට වග කිවයුත්තෙක් නොවන්නාසේම, ඔහුට (දරුවාට) දඬුවම් ද නොපමුණුවයි.

මෙනමුදු, මිනිසාගේ කුඩා අවදියේ සිට මරණය දක්වා වූ සම්පූර්ණ කාලය තුලම සත්‍ය දෙවි කෙනෙක් (අල්ලාහ්) සිටින බව කියන සාක්ෂි ලොව

සෑම තැනකම පෙනෙන්නට ඇත. ඔහුගේ ආත්මයද එයට සාක්ෂි දරන්නේය.

එම නිසා, මිනිස් වර්ගයා අවංකව සිතාමතා ක්‍රියා කරන්නේ නම් අසත්‍ය දෙවිවරුන් සම්පූර්ණයෙන් හෙළා දකින අතර සත්‍ය දෙවියන් වූ අල්ලාහ් නොපසුබටව පිළිගනී. ඒ සඳහාවූ මාර්ගය ඔවුනට විවෘතව ඇත. නමුත් සෑමවිටම, නිරන්තරයෙන්ම ඔවුන් අල්ලාහ්ගේ පැවැත්ම කියාපාන නිදසුන් නොතකා ඔහුගේ මැවීම්වලට ප්‍රමුඛ ස්ථානයක් දී වැඳුම් පිදුම් කරන්නේ නම්, එයින් වන්නාවූ විපාකවලින් බේරීම ඉතාමත් දුෂ්කර වන්නේය.

එක් උදාහරණයක් :

දකුණු ඇමෙරිකාවේ, බ්‍රසීලයේ ඇති ඇමසෝන් මහා වනාන්තරයේ ගිණිකොන දෙසින් පිහිටි ස්ථානයක ජීවත්වන පුරාණ ගෝත්‍රිකයින්, ඔවුන් වැඳුම් පිදුම් කරන ප්‍රධාන පිළිමය වූ "ස්ක්වට්ච්" (Skwatch) පිළිමය තැබීම සඳහා කුඩා ගොඩනැගිල්ලක් තැනූහ. එම පිළිමය වනාහි ලොව ඇති සියල්ල මැවූ ශ්‍රේෂ්ඨතම දෙවියන් නියෝජනය කරන්නක් බව එම ගෝත්‍රිකයින්ගේ විශ්වාසය වේ. පසු දිනෙක එක් තරුණයෙක් එම පිළිමටය තමාගේ ගෞරවය පිරිනමා පුදපූජා කිරීමට පැමිණියේය. ඔහු තමාගේ මැවුම්කාරයා හා ආරක්ෂකයා ලෙස තදබල

විශ්වාසයක් ඇතිව එම පිළිමය පාමුල වැඳවැටී සිටින කල්හි වයස්ගත වූ මැක්කන් වසාගත් කුෂ්ඨ රෝගී බල්ලෙක් එම ගොඩනැගිල්ලට ඇතුළු විය. එම තරුණයා තම හිස ඔසවනවාත් සමගම ඔහු දුටුවේ බල්ලා පිටුපස කකුළක් ඔසවා එම පිළිමයේ තවත් පැත්තක මූත්‍රා කිරීමය. මෙම කැත ක්‍රියාව දුටු විගස ඔහු කෝපයට පත්වී බල්ලා එළවා දැම්මේය. නමුත් ඔහුගේ කෝපය ටිකින් ටික අඩුවී සාමාන්‍ය තත්ත්වයකට පැමුණුනු විට ඔහු කල්පනා කරන්නට විය. "එම බල්ලා කළ කැත ක්‍රියාව වළක්වාලීමට තරම් ශක්තියක් නොමැති, අහිංසක මෙම පිළිමය කෙසේ මගේ දෙවියන් වේද? විශ්වයේ අධිපති වේද?" යනු සිතිවිල්ලෙන් ඔහුගේ සිත අවුල් විය. දැන් ඔහුට වැටහුනේය. දෙවියන් (අල්ලාහ්) වෙන කොහේදෝ සිටිනු ඇත. මෙය ගලෙන් තැනූනු පිළිමයක් පමණි.

ඔහු දැන් දෙවිදිහකින් ක්‍රියාකරන්න පුළුවන. ඔකක්: ඔහු නියම දෙවියන් (අල්ලාහ්) ගැන සොයාබලා ඔහු වෙත සම්පූරණ විශ්වාසය තබා අවනතවීම, අනෙකා: තමාගේ සිතට විරුද්ධව හා අවංකභාවයෙන් තොරව ඔහු තමාගේ ගෝත්‍රිකයින්ගේ අසත්‍ය විශ්වාසය අනුව ගමන් කිරීම. ඇත්තෙන්ම, ඔහු එගොඩනැගිල්ල තුල දුටුදේ අල්ලාහ් විසින් ඔහුට දෙනු ලැබූ විශේෂ සංඥාවකි. මෙම සංඥාවෙන් ඔහුගේ නැමදීම වැරදි බව පෙන්වා දී ඇත.

මෙහි කී පරිදි, සෑම සමාජයකටම, ගෝත්‍රයකටම, ප්‍රදේශයකටම නබිවරුන් එවා ඇත. එම උතුම් අනාගත වක්තෘවරු අල්ලාහ් කෙරෙහි මිනිසා තුල පවත්නා ස්වාභාවික විශ්වාසය වැඩි දියුණු කර ගැනීමට අනුබල දුන්නා පමණක් නොව, මිනිසා තුල රැඳී පවත්නා අල්ලාහ්ට පමණක් නැමදීමේ කැමැත්තද ඉටු වීමට අල්ලාහ් විසින් අනාවරණය කරන ලද උපදේශයන්ද ගෙන දැක්වූහ. කෙසේ වෙතත්, බොහෝ නබිවරුන්ගේ ඉගැන්වීම් විකෘති කරන ලදුව, හොඳ නරක දේ පෙන්නුම් කරන කොටස් පමණක් ඉතිරිකර ඇත.

තව්රාත්හි දසපනත, ඒවා තහවුරු කරන බයිබලයේ නව ගිවිසුම, නොයෙක් සමාජයන්හි මිනිස් ඝාතනය, සොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම යන පාප ක්‍රියාවන්ට පවතින නීති පද්ධතිය යන කරුණු විකෘත වූ ඉගැන්වීම් සඳහා උදාහරණ වේ.

ඉස්ලාමයේ විකෘති කිරීමක් නැත. එය අල්ලාහ් විසින් දෙනු ලැබූ ඒ ආකාරයෙන්ම අදත් පවතී. මෙවැනි හේතූන් නිසා අල්ලාහ් කෙරේ සම්පූර්ණ වූ විශ්වාසයක් තැබීම, ඔහුට මුළුමනින්ම අවනතවීම, ඔහුගේ ආගම වන ඉස්ලාමය පිළිගෙන ඒ අනුව ජීවත්වීම යනාදිය ගැන මිනිසා අල්ලාහ්ට වගකිව යුත්තේය.

## නිමාව

"ඉස්ලාම්" යන වචනය ඉස්ලාමීය ඉගැන්වීමේ මූලික සංකල්පය වන අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම යටහත්භාවය දැක්වීමේ අර්ථය විදහ දක්වන අතර "ඉස්ලාම්" යන නම මිනිසා විසින් නොව එකම දෙවියා වූ අල්ලාහ් විසින් තෝරාගත් බවත් පෙර සඳහන් කරන ලද කරුණුවලින් මනාව ඔප්පු වේ. මිනිසා දිව්‍යමය වශයෙන් දෙවියාට වන්දනාමානය කිරීම කෙරෙහි නැඹුරු වී ඇති බැවින්ද, මෙම සංකල්පය දෙවියා විසින් සෑම යුගයකම සෑම තනි පුද්ගලයෙකුගේම සිත් සතන් තුල ආරූඪ කර ඇති බැවින්ද සෑම යුගයකම විසූ මිනිසා විසින් ඉස්ලාමය පිළිගෙන ඇති බව මනාව පැහැදිලි වේ.

(අල්ලාහ්ට යටහත්භාවය දැක්වීම) යන අර්ථයෙන් සමන්විත "ඉස්ලාම්" නාමය ඉස්ලාමයේ අල්ලාහ් තආලාගේ අසහාය සහ අති විශිෂ්ඨ බව පිළිගැනීමේ මූලික සංකල්පය විදහ දක්වයි. තවද ආරම්භ යුගයේ සිට භාෂාව කුමක් වුවද, ඉස්ලාම් සෑම මිනිසෙකුටම සෑම කාලයකටම සුදුසු උචිත වන ආකාරයට පැවැති බවත් මින් ඉදිරියේදීත් සත්‍ය ආගමක් ලෙස එසේම පවතින බවත් මනාව ඔප්පු වේ.

අවසන් වශයෙන් අල්ලාහ් විසින් පෙන්වනු ලැබූ නිවැරදි මාර්ගයේ සදාකල් ගමන් කිරීමට මග

පෙන්වන ලෙසත් ඔහුගේ දයාව, අනුකම්පාව හා ආශිර්වාදය අපට දායාද කරන ලෙසත් විශ්වයාධිපති හා අති විශිෂ්ඨ වූ අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කරමු. තවද, ප්‍රශංසාව හා කෘතඥතාවය ඔහුටම හිමිය. සමාදානය හා අශිර්වාදය මුහම්මද් (සල්) තුමා වෙතද එතුමාගේ අඩිපාරේ ගමන් කරන අනුගාමිකයින්ටද අත්වේවායි පතමු.

**********